# වේදිකාව කියන්නේ මගේ ජීවිතය

## -යශෝදරා සරච්චන්ද්‍ර



යශෝදරා සරච්චන්ද්‍ර ගැන කියන්න අටුවා ටීකා අවශ්‍ය නැහැ. ඈ කාගේ කවුද කියන එක නොදන්නේ කවුද? ඒත් කාලෙක ඉඳලා ඇගේ රංගනයක් ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන්ට දකින්න ලැබුනෙම නැහැ. ඇය රංගනයෙන් ඈත් වෙලාද කියලා දැනගන්න යශෝදරාට කතා කළා.

**රංගනයෙන් ඈත් වෙලාද?**

වේදිකාවෙන් මම කවදාවත් ඈත් වෙන්නෙ නැහැ. වේදිකාව කියන්නේ මගේ ජීවිතයම. ඉස්සර වගේ මට ලංකාවේ වේදිකාවේ රඟපාන්න බැරි හේතුව ඇත්තටම දැන් මගේ පදිංචිය ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න්වල නිසා.

**ඔබේ පියා මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ නිර්මාණ අපේ ඉදිරි පරපුර වෙත රැගෙන යාම ඔබෙත් වගකීමක්?**

පැහැදිලිවම ඔව්, ඒත් දැනට මගේ අම්මා ඒ සියල්ල බොහොම සාර්ථකව කරගෙන යනවා. ඒ තුළින් අද විශාල තෘප්තියක් ලබනවා, පසු කාලෙක මං ඒ වගකීම භාර ගන්න සූදානමින් ඉන්නවා. මම වගේම මගේ අක්කා සහ මල්ලිත් තාත්තාගේ අඩිපාරේ යමින් වේදිකාව කෙරෙහි බැඳීමෙන් ඉන්නවා.



**මේ වෙනකොට ඔබේ පදිංචිය ඕස්ට්‍රේලියාවෙ, එය වේදිකා රංගනය මඟ ඇරලා නේද?**

අද වෙනකොට මමත්, මගේ සැමියා කුසුම්සිරි සහ දරුවන් පදිංචි වෙලා ඉන්නේ ඕස්ට්‍රේලියාවෙ, එහෙම බලනකොට මම රංගනයෙන් යම් ප්‍රමාණයකින් දුරස් වෙලා තමයි. නමුත් මම වේදිකාව අත ඇරලා නැහැ. කලින් කිව්වා වගේ වේදිකාවඉකියන්නේ මගේ ජීවිතය. රඟනොපානවාම නෙවෙයි, අදටත් මම රඟපානවා, සංගීතය සපයනවා, වෙස් නිර්මාණය වෙනවා.ඒ ඕස්ට්‍රේලියාවෙ. ලංකාවේ වේදිකාවේ දකින්න නැති නිසා තමයි මම දුරස් වෙලා වගේ පේන්නේ.

**ඔබත්, වේදිකාවත් අතර බැඳීමට විසි වසරක් පමණ වෙනවා, එදාට සාපේක්ෂව අද ශ්‍රී ලාංකේය වේදිකාවට තියෙන තැන පිළිබඳව ඔබ සෑහීමකට පත් වෙනවාද?**

කොහෙත්ම නැහැ, එදාට වඩා අද වේදිකාව පාළු වෙලා. ඒ ශිල්පීන් අතර ඇති තේරුම් නොගැනීම නිසා. ප්‍රේක්ෂක රස වින්දනය ගැන වැටහීමක් සමහර නිර්මාණකරුවන් තුළ තියෙනවාද කියන ප්‍රශ්නය වගේම, නාට්‍ය ශිල්පීන් තුළින් විනය,ජවය ගිලිහිලා ගිහින් කියලත් දැනෙනවා. තාත්තා නාට්‍ය පුහුණුවීම් කරනකොට අපි අපේ කොටස විතරක් රඟපාලා,අනෙක් අයගේ කොටස් පුහුණුවෙනකොට පැත්තකට වෙලා හිටියෙ නැහැ. තාත්තා එහෙම පැත්තකට වෙලා ඉන්න දුන්නෙත් නැහැ. වෙන කෙනෙක් තමන්ගේ චරිතය කරද්දි අපිත් වේදිකාවේ ඉන්න ඕන. ගීතවලට දායක වෙන්න ඕන. ඒ නිසාම ඒ නාට්‍ය වල ප්‍රාණවත් බවක් තිබුනා. වර්තමානයේ ඒ විනයානුකූල බව ගිලිහිලා වගේම පිරිහිලා. ප්‍රේක්ෂකයන් වේදිකාවෙන් දුරස් වෙන්න ඒක දැඩි හේතුවක්.

**ඒ විනය ඔබ ඕස්ට්‍රේලියාවේ වෙසෙන දරුවන් තුළ ඇති කරන්න උත්සහ කරනවා?**

ඔව්, ඒ මම ඒ පිළිවෙලට කැමති නිසා වගේම, අපේ වේදිකාව ගරා වැටෙනවාට ඇති අකැමැත්ත නිසා. මමත් මගෙ මහත්තයා කුසුම්සිරිත් ඕස්ට්‍රේලියාවේ වෙසෙන, වේදිකාවට ආදරය කරන දරුවන්ට නාට්‍ය පුහුණුවීම් කරනවා. නාට්‍ය කිහිපයක් අපි ඕස්ට්‍රේලියාවේ පෙන්නුවා. ඒ නාට්‍ය පුහුණුවීම් වලදී මම මගේ තාත්තාගෙ නාට්‍ය කණ්ඩායම් තුළ අත්විඳපු සාමූහික බව, විනය රැකගන්න උත්සාහ කරනවා.

බුද්ධිනී ජයවර්ධන

# BUNNINGS වලින් බනිස් කෑ අපේ නිළිය




ලංකාවේ ජනප්‍රිය ටෙලි නිළියක් ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරට එනවා ටෙලිනාට්‍යකට. ඒ ඕස්ට්‍රේලියාවේ අපේ ගජ මිතුරෙකුගේ නාට්‍යයකට. එයා ආපු ගමන්ම කියන්නේ එයාට ඒන කෑම වර්ග. එයා වැඩිපුරම කෑම කන්න කැමති 'SUBWAY' එකෙන්ලු, එයාට අරක ඕනලු මේක ඕනලු, දැන් ඉතින් කරන්න දෙයක් නෑ. නිශ්පාදකවරුන්ට ඈට කැමති තැන් වලින් කෑම අරගෙන දෙන්න වෙනවා. මේක ටිකක් කරදරයක්. කරන්න දෙයක් නැහැ. හැබැයි එක්කෙනෙක් මේ නිළියට අපූරු ගේමක් දෙනවා. නංගි හැමදාම 'SUBWAY' එකෙන් කන එක දැන් ඇතිවෙලා ඇතිනේ, තව හොඳ තැනක් තියෙනවා 'BUNNINGS' කියලා ඒකෙනුත් කාල බලන්න කියලා. එයා ඒකට කැමති වෙලා.

එක්තරා උදෑසනක ඈය කියනවා අද මට 'BUNNINGS' එකෙන් කෑම ඕන කියලා. මේ ජ්ලෑන ගහපු කෙනා ඈට දීපු මේ ලණුව ගැන හැමෝටම කියල තිබුනා. අපේ හිතවත් මිත්‍රයා කියනවා එහෙනම් අද මෙයාට 'BUNNINGS' එකෙන් කෑම අරන් දෙන්න කියල. ඈයත් සමග තවත් පිරිසක් යවනවා ඈයට කෑම අරන් දෙන්න. ඇතුලට ගියාම ගෑනිට හොඳටම ලැජ්ජ හිතෙනවා. අනේ අපේ ජනප්‍රිය නිළියෝ.....

මේක සන්නසේ පළවෙන නිසා 'BUNNINGS' ගැන අමුතුවෙන් කියන්න ඕනෙ නෑනෙ....

# දිල්වාලේ අලුත්ම පෝස්ටරය




ශාරුක් සහ කාජල්ගේ ප්‍රේමාන්විත රංගනය රැගත් 'දිල්වාලේ ' චිත්‍රපටය පසුගියදා එළිදැක්වුන අලුත්ම පෝස්ටරය ගැන කාගේත් අවධානය යොමු වෙලා.

50 හැවිරිදි ශාරුක් රිදී තිරයේ තමා සමග ඉහළින්ම වැජඹෙන කාජල් සමග ලෙදර් ජැකැට්ටුවකින් සැරසිලා සිටින තේජාන්විත පෙනුම අනෙක් අය පරදවන්නට සමත් වෙලා කියලයි කියන්නේ.

දෙසැම්බර් 18 වැනිදා 'දිල්වාලේ ' චිත්‍රපටය තිරගත වනතුරු ශාරුක්ගේ ඉන්දියානු මෙන්ම ලොව වටා සිටින අනෙකුත් ප්‍රේක්ෂකයනුත් නොඉවසිල්ලෙන් බලන් ඉන්නවා.